# මගේ අම්මාගේ

# කණ්ණාඩි කුට්ටම



විමුදි ඉමෙත්මා සේනාරත්න

# මගේ අම්මාගේ කණ්ණාඩි කුට්ටම

## විමුදි ඉමෙත්මා සේනාරත්න

කතෘ

කතෘගේ වෙනත් කෘති: මලිති හරි හොද ළමයෙක්

පාසල: මහමායා බාලිකා විදුහල. මහනුවර

ඉගෙනුම ලබන පංතිය: 3A

කෘතිය පළ කරන දිනය:2026/04/25

ISBN: 978-624-211-036-3

# පිදුම

මාගේ දයාබර

මහමායා මෑණියන්ට

හද බැතින්

පුද කරමි!

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අන්නගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කල හැක. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත් කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිශ්ට ජයග්‍රහනයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්න්වේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි.එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරනයෙන් දායක වූ පාසල් දරුවන් හට මඟ පෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.


ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස් .අභයකෝන්,<br>
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.<br>
සම්මානිත මහාචාර්ය ,පේරාදෙණිය විශ්වවිද්‍යාලය.<br>
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතියක් සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී .එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ .ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා ප්‍රාර්ථනා කරමී .

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

මගේ අම්මා ඇස් කණ්ණාඩි දානවා.

අම්මා කියන්නේ අම්මාගේ ඇස් පේනවා මදි කියලා.

අම්මාට පොත් කියවන්න අමාරුයි.

සමහර වෙලාවට පාරේ යනකොට දුර තියෙන දැන්වීම් කියවන්නත් අමාරුයි.

අම්ම ටීචර් කෙනෙක් නිසා කොම්පියුටරේ උගන්නනකොට තිරය දිහා බලාගෙන ඉන්නත් අමාරුයි.



ඉතින් අම්මා හැම වෙලේම කණ්ණාඩි දාගෙනමයි ඉන්නේ.

සමහර වෙලාවට අමතක වෙලා කණ්ණාඩි දාගෙනම නිදාගන්නත් යනවා.



සමහර වෙලාවට අම්මාගේ කන්ණාඩි කුට්ටම දාගෙන මමත් සෙල්ලම් කරනවා.

ඒකට අම්මා කැමති නෑ.

කන්ණාඩි කුට්ටම කැඩෙයි කියලා අම්මා බයයි.

මගේ ඇස් දෙකට හානි වෙයි කියලත් බයයි.



සමහර වෙලාවට මටත් හිතෙනවා කන්ණාඩි දාන්න.


ඒත් අම්මා කියන්නේ "අපොයි එපා " කියලා.

අම්මා කියන්නේ ඇස් පෙනීම හොඳට තියෙන එක වාසනාවක් කියලා.

ඇස් පෙනීම හොදින් තියාගන්න
හොඳට එළවලු , මාළු ,පලා ජාති කන්න ඕනෙ

හොඳට වතුර බොන්නත් ඕනෙ

පරිගනක තිරය ගොඩක් බලන්න හොඳ නෑ




ඉර එළිය වැඩි වෙලාවට අවු කණ්ණාඩි දාන එකත් හොඳ පුරුද්දක්ලු.

අව් කණ්ණාඩි දාන්නේ ලස්සනට වගේම ඇස් වල ආරක්ෂාවට ලු.

අපේ අම්මා මට ලස්සන අවු කණ්ණාඩි අරන් දුන්නා.

අව්වේ යන වෙලාවට මමත් කවු කණ්ණාඩි දාගෙන යන්න ආසයි.

ඇත්තටම එතකොට ඇස් වලට හරි ලේසියි කියලා මටත් තේරුනා



මගේ අවු කණ්ණාඩි පරිස්සම් කරගන්න කියලා අම්මා කිව්වට, සමහර වෙලාවට අම්මාගේ කණ්ණාඩි කුට්ටම තිබ්බ තැන අම්මාට අමතක වෙනවා.


ඉතින් අම්මයි මමයි දෙන්නම අම්මගේ කණ්ණාඩි කුට්ටම ගෙදර හැම තැනම හොයනවා,



අම්මාට වැඩ වැඩි වෙලාවට කණ්ණාඩි කුට්ටම හොයන්නේ මම.

මම දන්නවා හොඩක් වෙලාවට කණ්ණාඩි කුට්ටම තියෙන්නේ කාමරේ කණ්ණාඩි මේසේ උඩ

නැත්තම් නාන කාමරයේ.



ඉතින් මම කොහොම හරි කන්ණාඩි කුට්ටම හොයලා දුන්නාම අම්මාට සතුටුයි.

මටත් සතුටුයි.

අම්මා කන්ණාඩි කුට්ටම නැතිව ගෙදරින් එළියට බහින්නවත් කැමති නෑ.



දවසක් ගමනක් යන්න ලෑස්ති වෙලා අම්මයි මමයි දෙන්නම අම්මගේ කන්ණාඩි කුට්ටම හොයනවා.

පරක්කු වෙයි කියලා බොහොම කලබලෙන් හොයල හොයලා “අනේ දෙයියනේ කන්ණාඩි කොහේ තිබ්බද ?”කියලා ඔළුවේ අත ගහනකොට මෙන්න කන්ණාඩි දෙක ඔළුවේ.

අපි දෙන්නටම හොඳටම හිනා!



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කළ මෙම කියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අන්නගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපතද සමව පරිහරණය කලයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අත්කිසිවකින් වත් ලබ්බදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම් මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි.පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දෙක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ දියණියන්,, විදුහල්පතිතුමිය,ගුරු භවතුන් , දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද , දියවඩන නිලමේ තුමන් ඇතුළු දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමි.

සෙනෙවිරත්න මහලේකම්

ව්‍යාපෘති නිර්මාතෘ

**ISBN: 978-624-211-036-3**